කොළඹ විශ්ව විද්‍යාලය

ශාස්ත්‍රවේදී දෙවන වසර විභාගය -2017/18

(පළමු සෙමෙස්තර අවසානය)

# ECN 2112: මූල්‍ය ගිණුම්කරණය හැඳින්වීම

**කාලය: පැය දෙකක් (02ක්) පමණි**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න**

**මෙම ප්‍රශ්න පත්‍රය ලකුණු 60කින් සමන්විත වේ.**

---

ප්‍රශ්න අංක 01

1. සමාගමක පාර්ශවකරුවන් වර්ග 5 ක් නම් කර ඔවුන්ට සමාගම කෙරෙහි ඇති ලැදියාව (interests) ලියා දක්වන්න (ලකුණු 10)
2. ගණකාධිකාරීන් සාමාන්‍යයෙන් ගිණුම් සකස් කරනු ලබන්නේ නිශ්චිත උපකල්පන මතය. එවැනි උපකල්පන 05ක් නම් කර එය විස්තර කරන්න (ලකුණු 05)

ප්‍රශ්න අංක 02

1. ද්විත්ව සටහන් සංකල්පය ඔබ හඳුනා ගන්නේ කෙසේද? (ලකුණු 3)
2. පහත දැක්වෙන ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් සකස් කරන්න. (ලකුණු 12)
   (i) විමල් මහතා රුපියල් 800 000 ආයෝජනය කර විමල් සමාගම ආරම්භ කරන ලදී.
   (ii) සාමාගම රුපියල් 100 000 වටිනා ගෘහ භාණ්ඩ මිලදී ගන්නා ලදී.
   (iii) සාමාගම ලංකා බැංකුවෙන් රුපියල් 500 000 ක ණය මුදලක් ලබාගන්න ලදී.
   (iv) සාමාගම රුපියල් 100 000 වටිනා කොටස් මිලදී ගන්නා ලදී.
   (v) රුපියල් 120 000 වටිනා භාණ්ඩ ABC සමාගමට විකුණන ලදී.
   (vi) සාමාගම රුපියල් 10 000 ලංකා බැංකුවෙන් ලබාගත් ණය සඳහා පොලිය වශයෙන් ගෙවන ලදී.

ප්‍රශ්න අංක 03

1. ගණකාධිකරුවන් දත්ත ඇතුලත් කිරීමේදී හා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සිදුකරනු ලබන වැරදීම් නිසා සාමාගම් වලට මුහුණ දීමට සිදුවන ගැටලු තුනක් සඳහන් කරන්න (ලකුණු 3)
2. කෙසර සමාගමේ ශේෂ පිරික්සුම සකස් කිරීමේදී රුපියල් 15 000 අඩුවක් හර කොටසෙහි හඳුනා ගන්න ලදී. පහත දෝෂ හඳුනා ගත් අතර ඒ සඳහා නිවැරදි ජර්නල් සටහන් සකස් කරන්න. (ලකුණු 12)
   (i) රුපියල් 16 000ක විදුලි බිල ශේෂ පිරික්සුමට ගොණුකර නොතිබීම.
   (ii) රුපියල් 10 000 ක පොලි ලැබීම ශේෂ පිරික්සුම හර වශයෙන් සටහන් කර ඇත.
   (iii) රුපියල් 130 000 මිලදී ගැනීම රුපියල් 150 000 ලෙස සටහන් කර තිබීම.
   (iv) ණය සඳහා ගෙවීම් මුදල් පොතෙහි පමණක් සටහන් කර ඇත

(v) විදුලි බිල්පත් ගිණුම රුපියල් 34 000 ලෙස සටහන් කර තිබුණත් එය රුපියල් 43 000ක් විය යුතුය.

පහත දක්වා ඇත්තේ XYZ සාමාගමේ ලෙජර ගිණුම් තුලනය කිරීම මගින් ලබාගත් තොරතුරුය. එම තොරතුරු ආශ්‍රය කරගෙන ප්‍රශ්න අංක 04 , 05 හා 06 යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

| <u>ගිණුම</u> | <u>ප්‍රමාණය (රුපියල්)</u> |
|---|---|
| මුදල් | 40 000 |
| ගෙවනලද කුලිය | 30 000 |
| විකුණුම් | 365 000 |
| මිලදී ගැනීම් | 150 000 |
| ප්‍රාග්ධනය | 250 000 |
| වාහන | 400 000 |
| බැංකු ණය (15%) | 90 000 |
| ගෘහ භාණ්ඩ | 20 000 |
| ණය කරුවන් | 35 000 |
| ණය හිමියන් | 24 000 |
| රක්ෂණ වියදම් | 6 000 |
| ලැබුණු වට්ටම් | 8 000 |
| දෙන ලද වට්ටම් | 4 000 |
| ලිපිද්‍රව්‍ය | 5 000 |
| ස්ථාවර තැන්පතු (12 %) | 50 000 |
| පොලි අදායම | 3 000 |

අතිරේක තොරතුරු

- වාහන සහ ගෘහ භාණ්ඩ සහ වාහන 10% අනුපාතයක් යටතේ ක්ෂය විය යුතුය
- බොල් ණය රුපියල් 5 000
- පහත වියදම් ගෙවීමට ඇත

  විදුලි බිල රුපියල් 5 000

  දුරකථන බිල රුපියල් 2 000

**ප්‍රශ්න අංක 04**

ඉහත දෙන ලද තොරතුරු අනුව XYZ සාමාගමේ ශේෂ පිරික්සුම සකස් කරන්න. (ලකුණු 15)

**ප්‍රශ්න අංක 05**

ඉහත දෙන ලද තොරතුරු අනුව XYZ සාමාගමේ ලාභ සහ පාඩු ගිණුම සකස් කරන්න. (ලකුණු 15)

**ප්‍රශ්න අංක 06**

ඉහත දෙන ලද තොරතුරු අනුව XYZ සාමාගමේ ශේෂ පත්‍රය සකස් කරන්න. (ලකුණු 15)

****